# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2270/28 - 2022 මාර්තු මස 09 වැනි බදාදා - 2022.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: බල/2 /1/10 (ii)
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 03J/94/D/107.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

කොස්ගොඩ පොලිස් ස්ථානය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම :

ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 17 ඒ කොස්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ කොස්ගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද මු.පි.ගා. 3943 හා 2022.01.31 දිනැති සංශෝධිත පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4675 ක් පමණ වූ අතුවල ඉඩමේ උතුරු කොටස, පුංචි ලියද්ද *නොහොත්* පොඩි සනීගේ කොටුව සහ අත්තනවලවත්ත නමැති ඉඩම, කොස්ගොඩ පොලිස් ස්ථානය සඳහා අත්කර ගැනීම :

**01. කැබලි අංක 01 - අතුවල ඉඩමේ උතුරු කොටස, පුංචි ලියද්ද *නොහොත්* පොඩි සනීගේ කොටුව සහ අත්තනවලවත්ත - ප්‍රමාණය: හෙක්. 0.4675.**

උතුරට : යගව සෝමවතී ද සිල්වා සහ තවත් අය හිමිකම් කියන බකිනිගහ ලියද්ද, මාර්ගය හා මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ඩී. ඒ. පෙරේරා හිමිකම් කියන තම්බිතොට පදිංචි වත්ත; බස්නාහිරට: ඩී. ඒ. පෙරේරා හිමිකම් කියන තම්බිතොට පදිංචි වත්ත, කාල් වීරවර්ධන හිමිකම් කියන ඇලන් මෙන්ඩිස් පදිංචි වත්ත හා යගව සෝමවතී ද සිල්වා සහ තවත් අය හිමිකම් කියන බකිනිගහ ලියද්ද.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුම දෙනා තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 මැයි මස 09 වැනි දින පෙ. ව. 10.00ට බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 මැයි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආර්. එම්. අයි. බී. එම්. සී. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
බලපිටිය.

2022 මාර්තු මස 04 වැනි දින,

EOG 3-0803


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*